**මතුගම ප්‍රාදේශීය සභාව - 2022**

**------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

මතුගම ප්‍රාදේශීය සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට මතුගම ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

**1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)**

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්වය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරුකිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබලවන්නේ ඒවා දුස්සන්ධානයෙන් ,ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසාවන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශකිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම්කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත්වී ඇතිබව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(i)(ඈ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

### 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

#### 1.6.1 පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූල නොවීම

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ප්‍රමිතයේ පරිච්ඡේද අංක 3.27 සිට 3.32 ඡේදයන්ට අනුකූල නොවන ලෙස මුදල් ප්‍රවාහ ප්‍රකාශය ඉදිරිපත් කර තිබුණි. | 2023 වර්ෂයේ මුදල් ප්‍රවාහ ප්‍රකාශය නිවැරදිව සකස් කරන බව | පළාත් පාලන ආයතන සඳහා වූ රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කළ යුතුය. |
| (ආ) ප්‍රමිතයේ පරිච්ඡේද අංක 6.10 සහ 6.11 ප්‍රකාරව සභාව විසින් පෙර වර්ෂවල මෙන්ම සමාලෝචිත වර්ෂය සඳහාත්, ස්ථාවර වත්කම් ක්ෂය ගැලපීම් කර නොතිබුණි. | 2023 වර්ෂයේදී ස්ථාවර වත්කම් තක්සේරු කර එම වත්කම් සඳහා ක්ෂය ගැලපුම් සිදු කරන බව. | ප්‍රමිති ප්‍රකාරව ස්ථාවර වත්කම් සඳහා ක්ෂය ගැලපීම් කළ යුතුය. |

#### 1.6. 2 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2020,2021 හා 2022 වර්ෂයන් සඳහා රජයෙන් ලද ප්‍රාග්ධන ප්‍රදාන පිළිවෙලින් රු.122,809,943, රු.17,804,231 ක් හා රු.4,185,651 ක් අතිරික්තයේ හෝ ඌනතාවයේ හඳුනා නොගත් ප්‍රාග්ධන ප්‍රදාන ගිණුමට බැර කර නොතිබුණි. | 2023 වර්ෂයේදී මූල්‍ය ප්‍රකාශන නිවැරදි කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරන බව | රජයෙන් ලද ප්‍රාග්ධන ප්‍රදාන නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) 2020 හා 2021 වර්ෂයන්හිදී ක්‍රියාත්මක කරන ලද රු.150,475,217 ක් වූ පාරවල්,බෝක්කු හා පාලම් ඉදි කිරීම් ව්‍යාපෘති 250 ක් ස්ථාවර වත්කම් ලෙස ගිණුම්ගත කර නොතිබුණි. | - එම - | පාරවල් ,බෝක්කු හා පාලම් ස්ථාවර වත්කම් ලෙස ගිණුම්ගත කළ යුතුය. |
| (ඇ) 2021 වර්ෂය සඳහා සමාලෝචිත වර්ෂයේදී ලද වැටුප් ප්‍රතිපූර්ණ මුදල් රු.8,352,453 ක් මුදල් හර කර ලැබිය යුතු වැටුප් ප්‍රතිපූර්ණ ගිණුම බැර කරනු වෙනුවට ප්‍රවර්තන වර්ෂයේ වැටුප් ප්‍රතිපූර්ණ ආදායම් ගිණුම බැර කර තිබුණි. | - එම - | වැටුප් ප්‍රතිපූර්ණ ආදායම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ඈ) සමාලෝචිත වර්ෂය තුල මිලදී ගන්නා ලද පුස්තකාල පොත්, පිරියත හා කාර්යාලීය උපකරණ එකතුව රු.1,370,848 ක් අදාල වත්කම් ගිණුම හර කොට මුදල් බැර කිරීමට අමතරව එම වටිනාකමින් වත්කම් මිලදී ගැනීමේ වියදම් ගිණුම හර කර සංචිත හා වෙන් කිරීම් ගිණුම බැර කර තිබුණි. | - එම - | ස්ථාවර වත්කම් මිලදී ගැණුම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ඉ) 2022 දෙසැම්බර් 31 දිනට රු.77,200 ක් වූ කොම්පොස්ට් පොහොර තොගයේ වටිනාකම ගිණුම්ගත කර නොතිබුණි. | - එම - | සියලු තොග ගිණුම්ගත කළ යුතුය. |

### 1.7 අනුකූල නොවීම්

**නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ(158) වගන්තිය | හිඟ වරිපනම් අයකර ගැනීමේ අවසන් පියවර ලෙසට දේපළ තහනම් කිරීම් කර නොතිබුණි. | රට තුල පැවති අර්බුදකාරී තත්ත්වය හේතුවෙන් දේපල තහනමකට යොමු නොවූ අතර ඉදිරියේදී දේපල තහනම් කිරීමේ කටයුතු සැලසුම් කර ඇති බව | ප්‍රාදේශීය සභා පනත ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ වියදම ඉක්ම වූ ආදායම රු.22,666,765 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ වියදම ඉක්ම වූ ආදායම රු.26,494,865 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2022 | | | | 2021 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 14,949,575 | 14,746,013 | 10,469,809 | 4,276,204 | 14,878,575 | 14,199,906 | 9,588,677 | 4,611,229 |
| (ii) | කුලී | 6,813,555 | 6,732,091 | 5,201,651 | 1,530,440 | 7,124,300 | 6,416,348 | 5,153,803 | 1,262,545 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 430,000 | 374,550 | 370,800 | 3,750 | 420,000 | 392,060 | 387,860 | 4,200 |
| (iv) | වෙනත් ආදායම් | 2,374,000 | - | 3,786,611 | - | 906,780 | - | 5,099,451 | - |
| | | 24,567,130 | 21,852,654 | 19,828,871 | 5,810,394 | 23,329,655 | 21,008,314 | 20,229,791 | 5,877,974 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) හිඟ වරිපනම් බදු කාල විශ්ලේෂණයට අනුව වර්ෂ 01-03 අතර හිඟය රු.3,491,705 ක්ද, වර්ෂ 03-05 අතර හිඟය රු.1,189,165 ක්ද, වර්ෂ 05-10 අතර හිඟය රු.661,005 ක්ද හා වර්ෂ 10 ට වැඩි හිඟය රු.163,037 ක් ද විය. | හිඟ ආදායම් හා බිල් කළ ආදායම් කඩිනමින් අයකර ගැනීම සඳහා විශේෂ වැඩ පිළිවෙලක් යොදා ඇති අතර එය සාර්ථකව ක්‍රියාත්මක වෙමින් පවතින බව. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ආ) සභාව සතු කඩ කාමර 105 න් කඩ කාමර 03 ක් වසා තිබූ අතර 2022 දෙසැම්බර් 31 දිනට හිඟ කඩ කාමර කුලිය එකතුව රු.2,054,750 ක් විය . | වසා දමා තිබූ කඩ කාමර නැවත බදුකරුවන්ට ලබා දීමට තීරණය කර ඇති අතර හිඟ කුළී මුදලින් මේ වන විට රු.936,000 ක් අය කර ගෙන ඇති බව. | -එම- |
| (ඇ) පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් 2022 දෙසැම්බර් 31 ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු.15,000,000 ක් හා මුද්දර ගාස්තු රු.118,424,750 ක් විය. | 2023.12.31 දිනට පෙර උපලේඛන සකස් කර ආදායම් ලබා ගැනීමට කටයුතු කරමින් සිටින බව. | හිඟ උසාවි දඩ හා මුද්දර ගාස්තු කඩිනමින් ගෙන්වා ගැනීමට කටයුතු කළ යුතුය. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතයේ පරිච්ඡේද අංක 18.7 ප්‍රකාරව දේපල, පිරියත හා උපකරණ ප්‍රත්‍යාගණනය කිරීම ප්‍රමිතයට අනුකූලව මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමක් ලෙස සැලකුවත් සභාව විසින් නව ගිණුම් ප්‍රමිතයට සංක්‍රමණය වීමේදී ගොඩනැගිලි හැර අනෙකුත් ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණනය කර නොතිබුණි. | 2023 වර්ෂයේදී වත්කම් ප්‍රත්‍යාගණනය කිරීමට කටයුතු කරන බව. | පළාත් පාලන ආයතන සඳහා වූ රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණනය කළ යුතුය. |

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කඩ කාමර බදු ගිවිසුම වර්ෂ 03 කට පමණක් වලංගු වුවද, වලංගු කාලය ඉක්ම වූ පසු බදු ගිවිසුම් අළුත් කිරීමකින් තොරව කුලී කඩ හිමියන් සිය ව්‍යාපාර පවත්වාගෙන ගොස් තිබූ අතර ගිවිසුම් අත්සන් කිරීමකින් තොරව කඩ කාමර 13 ක් කුලියට දී තිබුණි. | ඉදිරියේදි සියළුම කඩ කාමර ගිවිසුම් අළුත් කිරීමටත් ගිවිසුම්ගත නොවූ කඩ කාමර සඳහා ගිවිසුම්ගත වීමටත් තීරණය කර ඇති බව. | කඩ කාමර ගිවිසුම් අළුත් කිරීමට කටයුතු කළ යුතුය. |

**3.3 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 පෙබරවාරි 13 දින හා 2020 පෙබරවාරි 14 දින මිලදී ගන්නා ලද පිළිවෙලින් රු. 1,729,988 ක් හා රු.1,236,600 ක් වූ ජෙනරේටර් 02 වර්ෂයකට වැඩි කාලයක සිට ඌන උපයෝජිතව තිබුණි. | ඉදිරියේදී එම ජෙනරේටර් 02 කුලියට ලබා දීමේ වැඩ පිළිවෙලක් සකස් කිරීමට නියමිත බව | ජෙනරේටර් භාවිතයට ගැනීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කළ යුතුය. |

## 3.4 වත්කම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2022 අප්‍රේල් 26 දින අළුත්වැඩියා කටයුතු සඳහා ලබා දී තිබු JCB යන්ත්‍රය වෙනුවෙන් රු.571,100 ක් ගෙවීම් කර තිබුණද, සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අළුත්වැඩියා කටයුතු සිදු කර නොතිබුණි. | අළුත්වැඩියා කටයුතු සිදු කර මුදල් ගෙවීම් සිදු කළ ද, වාහනයේ පැවති දෝෂයම නැවත ඇතිවීම නිසා අළුත්වැඩියාව සම්පූර්ණ කර නිම වු පසු වාහනය සභාව වෙත ගෙන ඒමට කටයුතු කරන බව. | අළුත්වැඩියා කටයුතු කඩිනමින් අවසන් කර වාහනය ධාවනයේ යෙදවීම සඳහා කටයුතු කළ යුතුය. |
| (ආ) සභාව සතු ඉඩම් ලෙස හඳුනාගෙන තිබු ඉඩම් 252 න් ඉඩම් 48 කට අදාලව නීත්‍යානුකූල අයිතිය තහවුරු කිරිමට අදාල ලේඛන සභාව සතුව නොතිබුණි. | ඉඩම් 48 ක් සභාව වෙත පවරා ගැනීමට කටයුතු කර ඇති බව | සභාව සතු ඉඩම් සඳහා නිත්‍යානුකූල ලේඛන ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) 2015 වර්ෂයේ සභාව වෙත ලැබී තිබුණු ස්ටියර් ලෝඩර් යන්ත්‍රය සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් සභාව නමින් ලියාපදිංචි කර නොතිබුණි. | මෙම යන්ත්‍රය සම්බන්ධව කිසිදු ලියවිල්ලක් යන්ත්‍රය පරිත්‍යාග කළ පළාත් පාලන දෙපාර්තමේන්තුව සතුව නැති බව | අවශ්‍ය ලේඛන ගෙන්වාගෙන යන්ත්‍රය සභාව නමින් ලියාපදිංචි කිරිමට අවශ්‍ය කටයුතු සිදු කළ යුතුය. |

## 3.5 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය තුළ බෙලිවත්ත කන්ද ජල ව්‍යාපෘතිය සඳහා බස්නාහිර පළාත් පාලන දෙපාර්තමේන්තුව රු.2,000,000 ක් සභාවට ලබාදී තිබුණද, සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් වතුර මෝටරය හා ජලනල පමණක් මිලදී ගෙන තිබු අතර ජනතාවගේ පානීය ජල අවශ්‍යතා සපුරා නොතිබුණි. | ව්‍යාපෘතිය සඳහා වෙන් කළ මුදල ප්‍රමාණවත් නොවු බැවින් අදියර 02 යටතේ වැඩ අවසන් කිරිම සඳහා උපදෙස් ලැබී ඇති බව | ව්‍යාපෘතිය කඩිනමින් නිම කර ජනතාවට එහි ප්‍රතිලාභ ලබා දීමට කටයුතු කළ යුතුය. |